**ශීර්ෂය 228 - අධිකරණ පරිපාලනය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

අධිකරණ පරිපාලනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 10 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලනයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 18 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අධිකරණ පරිපාලනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලනය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලනයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- අධිකරණ පරිපාලනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

**(ආ)** ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ - 6 ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය හා ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය අතර රු.3,011,069,162 ක වෙනසක් වූ අතර මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල සටහනක් මගින් හෝ හෙළිදරව් කර නොතිබුණි. | අදාල වෙනස්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වේ. | විගණන විමසුමෙන් පෙන්වා දී ඇති ඉකුත් වර්ෂයේ මූල්‍යය නොවන වත්කම් ප්‍රකාශයේ අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඇතුලත් කිරීමේ දී රු.3,011,069,162 ක වෙනසට හේතු වී ඇත්තේ සමාලෝචිත වර්ෂයේ තක්සේරු කරන ලද වත්කම් වල වටිනාකම් ආරම්භක ශේෂ ලෙස ඇතුලත් කිරීමත්, ප්‍රධාන කාර්යාලය විසින් මිලදීගෙන අනෙකුත් අධිකරණ වෙත නිකුත් කරනු ලබන වත්කම් ප්‍රධාන කාර්යාලයේ සිගාස් වැඩසටහනෙන් ඉවත් කර අදාල මහාධිකරණයේ ආරම්භක ශේෂ ලෙස සිගාස් වැඩ සටහනට ඇතුළත් කිරීමත්ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී වැඩ ආරම්භ කරන ලද නාවුල මහේස්ත්‍රාත් අධිකරණයේ නිල නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාලව 2019 පෙබරවාරි 15 දින ගෙවන ලද රු.4,255,520 ක වැඩ අත්තිකාරම් මුදලින් අයකර ගෙන නොතිබූ රු.3,700,452 ක් ද ඉකුත් වර්ෂයේදී ඉදිකිරීම් ව්‍යාපෘති 04 කට සහ 2017 වර්ෂයේ දී ඉදිකිරීම් ව්‍යාපෘති 02 කට අදාලව ගෙවන ලද රු.38,667,610 ක් වූ වැඩ | 2016 අගෝස්තු 03 දිනැති අංක 250/2016 (i) දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කුලී හා වැඩ අත්තිකාරම් ඒසීඒ - 05 (ඒ) ආකෘතියේ ඇතුළත් කළ යුතු වේ. | 2019 ජූලි 10 දිනැති 2018 වර්ෂය සඳහා විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව මගින් මේ සම්බන්ධව විමසීමෙන් අනතුරුව ආරම්භ කරන ලද සියළුම ව්‍යාපෘති සඳහා නිකුත් කරනු ලැබූ අත්තිකාරම් වෙනුවෙන් රා.ගි.ච 250/2016(1) හි 3 හා 4 ඡේද අනුව අත්තිකාරම් ගෙවීම හා අයවීම ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත. විගණන විමසුමට පෙර මෙම ව්‍යාපෘති සඳහා අත්තිකාරම් ලබා දී තිබූ බැවින් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සඳහා සංචිත ගිණුම් ආරම්භ කර නොමැත. |

| | | |
|---|---|---|
| අත්තිකාරම් මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගෙන නොතිබූ රු.23,130,608 ක් ද මූල්‍ය වත්කම් යටතේ අත්තිකාරම් ගිණුමට සහ කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුමට ඇතුළත් නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල මුළු වත්කම් හා මුළු වගකීම් ශේෂය රු.26,831,060 කින් අඩුවෙන් දැක්වුණි. | | |

### 1.6.2 අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1999 සහ 2000 වර්ෂයන්හි නොපියවා තිබූ රු.200,432,502 ක අග්‍රිම ශේෂ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් නොකිරීම නිසා මූල්‍ය වත්කම් ශේෂය සහ ජංගම වගකීම් ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | නොපිය වූ අග්‍රිම ශේෂ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වේ. | රු.200,432,502 ක් වූ 1999 හා 2000 වර්ෂයන්හි නොපියවූ අග්‍රිම ශේෂය ඉදිරියේ දී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.6.3 නීතිරීති රෙගුලාසි වලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ නීතිරීති, රෙගුලාසි වල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීතිරීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මුදල් රෙගුලාසි 109(1) හා (2) | වසර 02 සිට වසර 10 දක්වා කාලයක් තුළ අවස්ථා 62 ක දී වාහන අනතුරුවලට අදාලව සිදුවී තිබූ එකතුව රු.3,091,292 ක් වූ අලාභයන් | මුදල් රෙගුලාසි 109(1) හා (2) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විමසුමේ සඳහන් කර ඇති අලාභ හානි වර්ෂ ගණනාවක් පැරණි අලාභ හානි බැවින් ඒවාට |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | අදාලව පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධව පවතින ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට කටයුතු කර ඒ අනුව අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| **(ii)** මුදල් රෙගුලාසි 317 | නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ සේප්පුවල අගුල් දෙකේම යතුරු එක් පුද්ගලයෙකු භාරයේ තිබූ අතර නඩු භාණ්ඩ කාමරයේ පිවිසුම් දොරටුවේ යතුරු නඩු භාණ්ඩ භාරව කටයුතු කරන අධිකරණ ලිපිකාර සේවයේ නිලධාරිනිය විසින් පෞද්ගලිකව රැගෙන යාම ඒම සිදු කරමින් තිබුණි. | මුදල් රෙගුලාසි 317 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විට පිළිතුරු ලබා දී නොමැත. |
| **(iii)** මුදල් රෙගුලාසි 342 | නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ මුදල් භාර ගැනීමේ කුවිතාන්සි පොත් හා චෙක් පොත් විෂය ලිපිකරු ළඟ තබාගෙන තිබූ අතර පාවිච්චි කරන ලද මුදල් භාර ගැනීමේ කුවිතාන්සි පොත් සරප් ලඟ තබාගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 342 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විට පිළිතුරු ලබා දී නොමැත. |
| **(iv)** මුදල් රෙගුලාසි 396 (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට මහාධිකරණ කලාප 18 කට අයත් බැංකු ගිණුම් 47 ක බැංකුවට ඉදිරිපත් නොකරන ලද මාස 06 ඉක්මවූ රු.1,564,177 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. තවද නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයට සහ මාතලේ දිසා මහේස්ත්‍රාත් අධිකරණයට අදාල බැංකු ගිණුම්වල මාස 06 ඉක්ම වූ පිළිවෙලින් රු.25,000 ක් වටිනා චෙක්පත් 03 ක් හා රු.10,000 ක් වූ චෙක්පත සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන **(viii)** යටතේ දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අධිකරණ කලාපයන් හි මාස 06 ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 අනුව කටයුතු කරන ලෙස අදාල අධිකරණයන් වෙත උපදෙස් ලබා දී ඇත. |
| **(v)** මුදල් රෙගුලාසි 582(1) | නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ මුදල් පොතට අනුව 2019 සැප්තැම්බර් 04 දින දෛනික ලැබීම් වූ රු.223,916 ක මුදල 2020 ජනවාරි 20 වන විටත් බැංකුවේ තැන්පත් කිරීමට කටයුතු කර | මුදල් රෙගුලාසි 582 (1) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විට පිළිතුරු ලබා දී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | නොතිබුණි. තවද 2019 වර්ෂයේ දෛනික ලැබීම් බැංකුගත කිරීම් දින 2-5 අතර පමණ කාලයක් ප්‍රමාද වූ අවස්ථා විය. | | |
| | **(vi)** මුදල් රෙගුලාසි 586 (1) | නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ ගරු විනිසුරුවරුන් විසින් නඩු වලට අදාල දඩ පිළිබඳ සටහන් යොදා තිබුණ ද එම දඩ අය කර ගැනීම් හෝ නොගැනීම් පිළිබඳ විස්තර මුදල් රෙගුලාසි ප්‍රකාරව පවත්වාගෙන යනු ලබන ලේඛනයේ දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 586 (1) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විට පිළිතුරු ලබා දී නොමැත. |
| | **(vii)** මුදල් රෙගුලාසි 586 (2) | හිඟ දඩ මුදල් දැක්වෙන ලේඛනයක් වෙනමම පවත්වාගෙන යායුතු වුවත් නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ 2018 අගෝස්තු 30 දිනෙන් පසුව ආරම්භ කරන ලද හිඟ දඩ ලේඛනය යාවත්කාලීන පදනමක් මත පවත්වා නොගැනීම නිසා රජයට මේ වන විට අය වීමට තිබෙන සමස්ථ හිඟ දඩ මුදල් කොපමණද යන්න හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි. | මුදල් රෙගුලාසි 586 (2) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විට පිළිතුරු ලබා දී නොමැත. |
| | **(viii)** මුදල් රෙගුලාසි 880 හා 881 | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව සහ අංක 01/2011 හා 2011 ජනවාරි 18 දිනැති අධිකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය මඟින් දැනුවත් කර තිබුණු පරිදි නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 හා 881 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විට පිළිතුරු ලබා දී නොමැත. |
| | **(ix)** මුදල් රෙගුලාසි 891 | ඇප තැන්පත් තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විට පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන වගන්තිය | නාවලපිටිය මහේස්ත්‍රාත් විනිසුරු නිල නිවස ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාල අධිකරණ අමාත්‍යාංශ හා කොන්ත්‍රාත්කරු අතර 2019 සැප්තැම්බර් 17 දින රු.16,569,519 ක වටිනාකමකට එළඹ තිබුණු ලිඛිත ගිවිසුම ලියාපදිංචි කර නොතිබුණි. | 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිකිරීම් කොන්ත්‍රාත් වලට අදාල ගිවිසුම් ලියාපදිංචි කිරීමට අදාල කටයුතු පසුගිය කාලය තුළ නිසි පරිදි සිදු වී නොමැති අතර මේ වන විට ඒ පිළිබඳව කොන්ත්‍රාත් ආයතනය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | වෙත දන්වා එම ලියාපදිංචි සහතික ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 (ආ) | කන්තලේ අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2019 ජනවාරි 28 දිනැති ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අනුව ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කර තිබුණේ මාස 05 ක ප්‍රමාදයක් සහිතව 2019 ජූනි 24 දින දීය. . තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ ලංසු ඇපකරයේ වලංගු කාලය 2019 ජූනි 28 දිනෙන් අවසන් වී තිබූ අතර කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව පිළිනොගැනීම හේතුවෙන් ලංසු ඇපකරය මුදල් කර ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 (ආ) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ලංසු ඇප කරයේ වලංගු කාලය දීර්ඝ කර ගැනීමට කාලය ප්‍රමාණවත් නොවීම නිසා ලංසු ඇපකරය අයකර ගැනීමට නොහැකි වී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** මුදල් රෙගුලාසි 94 (2) ප්‍රකාරව එළඹිය හැකි බැරකම් වලට අයත් නොවන පුනරාවර්තන වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.11,991,505 ක බැරකම් වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මු.රෙ 94(1) අනුව අනුව පුනරාවර්තන ස්වභාවයේ වියදම් වෙනුවෙන් පසුගිය වර්ෂ 03ක සාමාන්‍යයෙන් 50%ක් දක්වා බැරකම් වලට එළඹීමේ හැකියාවක් පවතී. එබැවින් අධිකරණ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය බැවින් මුදල් රෙගුලාසි අනුව දක්වා ඇති සීමාවන් තුළ පමණක් බැරකම් සඳහා බැඳීම් ඇති කර ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | සටහන අංක **(iii)** යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය හා භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය **(SA 92** ආකෘතිය**)** අතර රු.7,927,289 ක වෙනසක් පැවතුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි 3.4 ඡේදය අනුව කටයුතු කළ යුතු වේ. | මෙම වටිනාකම පද්ධති දෝෂයක් හේතුවෙන් ඇතුළත් වී ඇති අතර මෙම මුදල තවදුරටත් ගෙවිය යුතු වටිනාකමක් නොවේ. SA-92 ආකෘතියෙහි කොටසක් පමණක් මුද්‍රණය වීම නිසා අවසන් ශේෂය ඇතුළත් තීරුව සහිත කොටස වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් වී නොමැත. |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වාර්ෂික සැසඳුම් ප්‍රකාශය අනුව හිඟ ණය ශේෂවල එකතුව රු.23,062,490 ක් වූ අතර ඒ තුළ ඇතුළත් වසර 05 කට වැඩිකාලයක් ගතවූ ණය ශේෂවල එකතුව රු. 7,964,872 ක් විය. එය මුළු හිඟ ණය ශේෂයෙන් සියයට 35 ක ප්‍රමාණයක් ගෙන තිබුණි. | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1 හා 3 ඡේද හා ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 4 වගන්තිය කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. | වසර 05කට වඩා වැඩි කාලයක් ගත වූ රජයට අයවිය යුතුව පවතින බොහෝ හිඟ ණය ශේෂ 1990 දශකයේ සිට අය නොවී පවතින ණය ශේෂ වේ. මේ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම සඳහා බොහෝ ණය ශේෂවල තොරතුරු අධිකරණ සතුව නොමැති බැවින් මෙකී ණය ශේෂ කපා හැරීමටද අසීරු වී ඇත. |
| **(ආ)** | 2019 දෙසැම්බර් 31 දිනට කේවල ණය ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතර රු.12,527,622 ක වෙනසක් විය. තවද මෙම වෙනසට හේතු වූ කරුණු පැහැදිලිව සඳහන් කර නොතිබුණි. පසුගිය ආසන්න වසර තුනක ශේෂයන් ද මෙලෙස නොසැසඳුනු අතර, එම අවස්ථා වලදී ද වෙනස සොයා බලා නිවැරදි කරන බවට දක්වා තිබුණද එය ඉටු වී නොතිබුණි. | 2017 ජුලි 05 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 256/ 2017 හි 05 ඡේදය අනුව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතර වෙනසක් ඇති විට එම වෙනසට හේතු වූ කරුණු පැහැදිලිව සඳහන් කළ යුතුවේ. | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය හා පාලන ගිණුම අතර පවතින මෙම නොසැසඳීම 90 දශකයේ සිට පැවත එන අතර විශේෂයෙන් මහාධිකරණ කලාප අතර අභ්‍යන්තර ස්ථාන මාරු වීම් යටතේ ණය ශේෂ නිරවුල් කර ගැනීමේ දී ඇති වී ඇති දෝෂයන් මේ සඳහා හේතු වී ඇත. එමෙන්ම අදාල දෝෂයන් නිවැරදි කර ගැනීමට මේ වන විට මහාධිකරණ කලාප සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කරගෙන යන බවද කාරුණිකව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට අධිකරණ කලාප විසින් ඉදිරිපත් කරන ලද අත්තිකාරම් “බී” ගිණුම් අනුව අධිකරණ කලාප 09 ක කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුම් ශේෂ අතර රු.803,269 ක වෙනසක් වූ අතර, ඉන් සමහර වෙනස්කම් වසර කිහිපයක සිට පැවති ඒවා විය. | 2017 ජුලි 05 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 256/ 2017 හි 05 ඡේදය අනුව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතර වෙනසක් ඇති විට එම වෙනසට හේතු වූ කරුණු පැහැදිලිව සඳහන් කළ යුතු වේ. | මහාධිකරණ කලාප විසින් ඉදිරිපත් කර ඇති ගිණුම් අනුව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුම අතර ඇති නොසැසඳුන ශේෂයන් වර්ෂ ගණනාවක සිට පැවත එන අතර, අධිකරණ මඟින් නිවැරදි ණය ශේෂයන් පොත් වල සටහන් නොකිරීම සහ නිලධාරීන්ගේ ණය ශේෂ පවරා දීමේදී සහ පවරා ගැනීමේදී සිදු වී ඇති අතපසු වීම් වැනි කරුණු මේ සඳහා විශේෂයෙන් හේතු වී ඇත. ඒ අනුව නොසැසඳුනු ශේෂ හඳුනාගෙන ඊට හේතු වූ කරුණු සොයා බලා නිවැරදි කිරිමට විශේෂ අවධානය යොමු කර කටයුතු කරන මෙන්ද එහි ප්‍රගතිය අමාත්‍යාංශය වෙත වාර්තා කරන මෙන්ද අදාල අධිකරණයන් වෙත දැනුම් දී ඇති අතරම එහි ප්‍රගතිය අමාත්‍යාංශය විසින් වරින් වර පරීක්ෂා කෙරේ. |
| (ඈ) | මහනුවර මහාධිකරණ කලාපයට ස්ථාන මාරු වී පැමිණි නිලධාරියකු වෙනුවෙන් නිරවුල් කළයුතු රු.22,380 ක ණය ශේෂය වසර 05 කට වැඩි කාලයක සිට පැවත එන්නක් විය. | ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ අදාල ආයතනවලට අප්‍රමාදව නිරවුල් කළ යුතු වේ. | මෙම ණය ශේෂය අවුරුදු 33 පමණ පැරණි ණය ශේෂයක් වන අතර මේ සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් සොයා ගැනීමට නොහැකි වී ඇත . තවද මෙම ණය ශේෂය කපා හැරීමට භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇතත් තොරතුරු ප්‍රමාණවත් නොවන බැවින් කපා හැරීමට කටයුතු කර නොමැත. |

2.3 **තැන්පතු ශේෂයන්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අධිකරණ කලාප 26 හි තැන්පතු වර්ග පහක් යටතේ වූ තැන්පතු ගිණුම් 570 ක රු.9,995,384,292 ක් වූ ශේෂයෙන් සහ කම්කරු විනිශ්චය සභාව යටතේ වූ තැන්පත් ගිණුම් 04 ක රු.116,040,713 ක් වූ ශේෂයන්ගෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කලයුතු ශේෂ හඳුනාගෙන නොතිබූ අතර මෙම තැන්පතු සඳහා කාල විශ්ලේෂණ ද ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අධිකරණ කලාප වලට අදාලව විශාල තැන්පතු ප්‍රමාණයක් පවතින බැවින් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම ප්‍රායෝගිකව අපහසු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| නාවලපිටිය පැරණි මහේස්ත්‍රාත් නිල නිවස ඉවත් කර, නව නිල නිවසක් එම ස්ථානයේම ඉදිකිරීම වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුව රු.18,156,471 ක මුදලකට කොන්ත්‍රාත් කරුවකුට ලබා දී තිබුණු අතර 2019 අගෝස්තු 02 දින ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කර තිබුණි. ඒ අනුව දින 14 ක් තුළ වැඩ ආරම්භ කළයුතු බවත්, කොන්ත්‍රාත් කාලය දින 270 ක් බවත් දක්වා තිබුණි. එහෙත් ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කර මාස 11 ක පමණ කාලයක් ගත වී ඇති නමුත් 2020 ජුලි 02 දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණු අතර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස 2019 නොවැම්බර් 27 දින කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබූ රු.5,474,984 ක ( Vat බදු සහිතව ) මුදල මාස 07 කට වැඩි කාලයක් කොන්ත්‍රාත්කරු වෙත රඳවා තබා තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | විනිසුරුතුමාට කුලී පදනම මත නිල නිවසක් ලබා ගැනීමට විනිසුරුතුමාගේ නිර්දේශ ද සහිතව යෝජිත ස්ථානය පිළිබඳ තොරතුරු අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. නමුත් මේ සඳහා අනුමැතිය ලබා දීම ප්‍රමාද වූ අතර ඒ සම්බන්ධයෙන් විමසීමේ දී යෝජිත ස්ථානය වෙනුවට වෙනත් ස්ථානයක් සොයාගැනීමට කටයුතු කිරීම සුදුසු බව අධිකරණ සේවා කොමිෂන් සභාව ලේකම් විසින් 2019 දෙසැම්බර් 19 දින දක්වා යවා ඇත. ඒ අනුව කටයුතු කර වෙනත් සුදුසු නිල නිවසක් සොයා දීමෙන් අනතුරුව 202 ජුලි 06 දින මෙම ඉඩමේ නව නිල නිවාස ඉදිකිරීම ආරම්භ කිරීමට කොන්ත්‍රාත් ආයතන වෙත භාර දී ඇත. |

**3.2 වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කන්තලේ නව අධිකරණයක් පිහිටුවීමට හඳුනාගෙන ඒ සඳහා 2018 සිට 2020 දක්වා වසර තුනක් තුළ මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුමැති ලැබී තිබූ අතර 2018 වර්ෂය සඳහා රු. මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. නමුත් එම වර්ෂයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම නිසා වෙන්කල ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.<br><br>සමාලෝචිත වර්ෂයේදී ද මෙම අධිකරණ සංකීර්ණය ඇතුළුව තවත් ඉදිකිරීම් තුනක් සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් රු.273,740,000 ක්ද මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මඟින් 40,000,000 ක්ද ලබාදී තිබුණි.<br>2019 ජනවාරි 28 දිනැති ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය අනුව 2019 ජුනි 24 දිනැති ප්‍රතිග්‍රහණ ලිපිය කොන්ත්‍රාත්කරු වෙත නිකුත් කර තිබුණද 2020 ජුලි 15 දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | ඇස්තමේන්තු සකස් කර ලබා ගත් ප්‍රතිපාදන අදාල කාර්යයන් සඳහා යෙදවිය යුතු වේ. | 2019 වර්ෂයට අදාල අතුරු සම්මත ගිණුම මඟින් මෙම ප්‍රසම්පාදන කාර්ය සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබූ අතර, 2019 වර්ෂය සඳහා අයවැය ප්‍රකාශයට පත් කරන තෙක් මෙම ප්‍රසම්පාදනය අවසන් කළ නොහැකිව තිබුණි. ඒ හේතුවෙන් ලංසු ප්‍රදානය කිරීමේ කටයුතු අවසන් කිරීමට නොහැකි වූ අතර, ලංසු වලංගු කාලය 2019 මැයි 31 දින දක්වාත්, ලංසු ඇපකරයේ වලංගු කාලය 2019 ජුනි 28 දින දක්වාත් දීර්ඝ කිරීමට කටයුතු කර ඇත. ඉන් අනතුරුව ලංසු ඇපකරයේ වලංගු කාලය ඇතුලත එනම් 2019 ජුනි 24 දින ප්‍රතිග්‍රහණ ලිපිය තෝරාගත් ලංසුකරුවන් ඉදිරිපත් කර ඇත. |

**3.3 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධයෙන් 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.5 වගන්තිය ප්‍රකාරව 2020 ජනවාරි 23 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.5 වගන්තියේ සඳහන් පරිදි කටයුතු කළ යුතු වේ. | 2020 අගෝස්තු 13 දින විටත් පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | ශ්‍රී ලංකාවේ අධිකරණ කලාප 33 කට අයත්ව අධිකරණ 221 ක් පිහිටි ඉඩම් අතුරින් ඉඩම් වල ප්‍රමාණය සඳහන් කර නොමැති | අධිකරණ අමාත්‍යාංශය සතු ඉඩම් වල නම, ප්‍රමාණය, මිනින්දෝරු | 2020 අගෝස්තු 13 දින වන විට පිළිතුරු ලබා දී නොමැත. |

| | |
|---|---|
| අධිකරණ සංඛ්‍යාව 50 ක් ද, ඉඩමේ අයිතිය අධිකරණ අමාත්‍යාංශය සතු යැයි තහවුරු කර ගෙන නොමැති ඉඩම් සංඛ්‍යාව 47 ක් ද, ඉඩමේ නම සඳහන් කිරීමට නොහැකි අධිකරණ සංඛ්‍යාව 135 ක් ද, මිනින්දෝරු සැලැස්ම නොමැති ඉඩම් 70 ක් ද, පැවරුම් සහතික නොමැති ඉඩම් 188 ක් ද වී තිබූ අතර ඉඩමේ වටිනාකම තක්සේරු නොකළ ඉඩම් සංඛ්‍යාව 174 ක් විය. | සැලැස්ම, පැවරුම් සහතික හා තක්සේරු වටිනාකම තහවුරු කර ගෙන ඒවා නිවැරදි තක්සේරු අගයන් මත ගිණුම්ගත කළ යුතු වේ. |

### 3.4 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙණු

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පූගොඩ දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ 2018 සහ 2019 වර්ෂ වලදී ව්‍යාජ ලිපි ලේඛන සකස්කර මුදල් අයකැමි තනතුරේ රාජකාරී කළ නිලධාරීයා විසින් රු.1,190,071 ක් අවභාවිත කර තිබුණි. | මෙවැනි අවභාවිතයන් නොවීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුවේ. | අධිකරණ වලට මුදල් ගෙවන පාර්ශවයන්ගෙන් ගෙවීම් වවුචරයක් (PIV - පොදු 118 ආකෘති පත්‍රය) සම්පූර්ණ කර ලබා ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම මඟින් ඉදිරියේ දී මෙවැනි මුදල් වංචාවන් තරමක් දුරට හෝ ඇති වීම පාලනය කර ගතහැකි බව දන්වා යවන ලදී. |

### 3.5 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නාවලපිටිය මහේස්ත්‍රාත් විනිසුරු නිල නිවස ඉදිකිරීම 2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඇතුළත්ව ඇතත් එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලිකම පියවර වූ ඉදිකිරීමට අදාල භූමිය නිරවුල් කර නොගැනීම මත ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | ඉදිකිරීම් කිරීමට ප්‍රථම යෝජිත භූමිය නිරවුල් කර ගැනීම කළ යුතු වේ. | මෙම ඉදිකිරීම 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට සහ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබූ අතර, ඒ හා සමගාමීව නිල නිවස හිස් කිරීමට ද වසර ආරම්භයේ සිටම අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබුණි.නමුත් අනපේක්ෂිත පරිදි කුලී පදනම මත ලබා ගැනීමට අපේක්ෂා |

| | | | |
|---|---|---|---|
| | | | කළ නිවාසය වෙනුවට වෙනත් නිවාසයක් සපයා ගැනීමට සිදු වූ බැවින් ව්‍යාපෘතිය සඳහා භූමිය නිදහස් කර ගැනීමට ප්‍රමාද විය. |
| **(ආ)** | නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ සවිකර තිබුණු CCTV කැමරා පද්ධතිය 2018 දෙසැම්බර් 05 දින වන විට අක්‍රිය වී අලුත්වැඩියාව සඳහා වාර්ෂික සේවාවන් සිදු කරනු ලබන ආයතනයෙන් ලබාගත් රු.232,731 ඇස්තමේන්තුවක් 2018 දෙසැම්බර් 24 දින කොළඹ මහාධිකරණය වෙත ඉදිරිපත් කර නැවත 2019 දෙසැම්බර් මාසයේදී සිහිකැඳවුම් කර තිබුණද 2020 ජනවාරි 20 දින වන විටත් මෙම CCTV කැමරා පද්ධතිය අලුත්වැඩියා කර නොතිබුණි. | අක්‍රිය තත්ත්වයට පත් වී තිබුණු CCTV කැමරා පද්ධතිය අප්‍රමාදව අළුත්වැඩියා කර ගත යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විටත් පිළිතුරු ලබා දී නොමැත. |
| **(ඇ)** | අධිකරණ කොමිෂන් සභා ලේකම්ගේ 2019 දෙසැම්බර් 19 දිනැති ෆැක්ස් පණිවුඩ දෙකක් මඟින්, එවකට නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ සේවයේ නියුක්තව සිටි අධිකරණ රෙජිස්ට්‍රාර්වරියන් දෙදෙනාම වහාම ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරු කර තිබූ අතර 2020 ජනවාරි 20 දින වන විටත් ඔවුන් භාරයේ තිබූ නඩු භාණ්ඩ, ලිපි ලේඛන, සේප්පු යතුරු භාර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාන මාරු වී යන නිලධාරීන් භාරයේ ඇති නඩු භාණ්ඩ ලිපි ලේඛන සහ සේප්පු යතුරු ආදිය අදාල නිලධාරීන්ට භාර දීමට අප්‍රමාදව කටයුතු කළ යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විටත් පිළිතුරු ලබා දී නොමැත. |
| **(ඈ)** | නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයට අදාලව 2019 සැප්තැම්බර් 19 සිට 2019 දෙසැම්බර් 26 දක්වා කාලය තුළ බැංකුවට සෘජුවම තැන්පත් කර තිබූ රු.1,132,860 ක් 2020 ජනවාරි 20 වන විටත් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබූ අතර එම ලැබීම් ප්‍රේෂණය කරද නොතිබුණි. | බැංකුව වෙත ලැබෙන සෘජු ලැබීම් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමටත කටයුතු කළ යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විටත් පිළිතුරු ලබා දී නොමැත. |

(ඉ) නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| (i) | වෙන්දේසි කිරීමට තීරණය ලැබී තිබේදැයි නඩු වාර්තා පරීක්ෂා කර නොතිබීම නිසා අධිකරණ භූමියේ වාහන 46 ක් ගාල් කර තිබුණි. | වෙන්දේසි කිරීමට තීරණය ලැබී තිබේ දැයි නඩු වාර්තා පරීක්ෂා කිරීම මඟින් තහවුරු කර ගත යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විටත් පිළිතුරු ලබා දී නොමැත. |
| (ii) | දීර්ඝ කාලයක් තිස්සේ අධිකරණ භූමියේ ගාල් කර තිබූ වාහන 08 කට අදාල නඩු අංක හා නඩු වාර්තා සොයාගෙන නොතිබුණි. | වෙන්දේසි කිරීමට තීරණය ලැබී තිබේ දැයි නඩු වාර්තා පරීක්ෂා කිරීම මඟින් තහවුරු කර ගත යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විටත් පිළිතුරු ලබා දී නොමැත. |
| (iii) | වාහන 18 ක් සඳහා 2019 වර්ෂයේ තක්සේරු වටිනාකම් ලබාගෙන තිබුණ ද 2020 ජනවාරි 22 දින දක්වාම ඒවාට අදාල නඩු වාර්තා, නඩු භාණ්ඩ අංශයට ලැබීනොතිබුණි. මින් වාහන 14 ක් 2020 වර්ෂයේ දී නැවත තක්සේරු කර තිබුණි. | නඩු වාර්තා පරීක්ෂා කර වෙන්දේසි කිරීමට නියෝග ලබාදී තිබේදැයි තහවුරු කර ගෙන තක්සේරු කළ යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විටත් පිළිතුරු ලබා දී නොමැත. |
| (iv) | 2019 ජූලි 07 දින පැවැත්වූ වෙන්දේසියට ඉදිරිපත් කර තිබුණු පාපැදි 12 ක නඩු වාර්තා සොයා ගැනීමට නොහැකි වීම නිසාත්, පාපැදි 04 ක නඩු කටයුතු අවසන් වී නොමැති නිසාත් වෙන්දේසියෙන් ඉවත් කර තිබූ අතර 2020 ජනවාරි 22 දිනය වන විටත් පාපැදි 12 හි නඩු වාර්තා නඩු භාණ්ඩ අංශයට ලැබී නොතිබුණි. | නඩු කටයුතු අවසන් වී තිබේද යන්න නිවැරදිව තහවුරු කර ගෙන භාණ්ඩ වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විටත් පිළිතුරු ලබා දී නොමැත. |
| (v) | නඩු භාණ්ඩ වශයෙන් උසාවියේ රඳවාගෙන තිබූ මුදල් සේප්පුවල තබා තිබුණි. | නඩු භාණ්ඩ වශයෙන් රඳවා ගන්නා මුදල් දිගු කාලයක් සේප්පුවල රඳවා තබනවා වෙනුවට වෙනත් සුදුසු වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීමේ හැකියාව පිළිබඳව සොයා බැලිය යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විටත් පිළිතුරු ලබා දී නොමැත. |

**4. මානව සම්පත් කළමනාකරණය**

**4.1 මානව සම්පත් සංවර්ධන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 අනුව ආයතනයේ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම, ආයතනයේ එක් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට පවරා නොතිබුණි. | 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විටත් පිළිතුරු ලබා දී නොමැත. |

**4.2 කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාර්ය මණ්ඩල වෙනස්වීම් අනුව යාවත්කාලීන කරන ලද කාර්ය මණ්ඩල තොරතුරු සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා නොතිබුණි. | 2017 සැප්තැම්බර් 20 දිනැති අංක 04/2017 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 අගෝස්තු 13 දින වන විටත් පිළිතුරු ලබා දී නොමැත. |

**4.3 අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආයතනයේ සේවක සංඛ්‍යාව පිළිබඳව විමසන ලද තොරතුරු වලට පිළිතුරු ලෙස 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රාථමික මට්ටමට අයත් තනතුරු 06 ක් සඳහා පමණක් අනුමත සේවක සංඛ්‍යාව 3,873ක් බවත් තත්‍ය සේවක සංඛ්‍යාව 3,588 ක් බවත් හා පුරප්පාඩු 285 ක් බවත් දක්වා තිබුණි. එහෙත් සමස්ත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ආයතනයේ සමස්ථ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | 2020 අගෝස්තු 13 දින වන විටත් පිළිතුරු ලබා දී නොමැත. |